ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**
**Business & Accounting Studies**

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2016 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2016

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
**வணிகக் கல்வியும் கணக்கீடும் I, II**
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුය :**
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා වෙන් වෙන් ව හඳුනාගත හැකි ය. මිනිස් අවශ්‍යතා පමණක් අන්තර් ගත කාණ්ඩය වනුයේ,
1. ආහාර, වාතය, ජලය, වින්දනය    2. ආහාර, නිවාස, ඇඳුම්, මෝටර් රථ
3. නිවාස, සන්නිවේදනය, විදුලිය, ඇඳුම්    4. ප්‍රවාහනය, අධ්‍යාපනය, විදුලිය, වින්දනය

02. අමල් හා කමල් යනු පාසල් සිසුන් දෙදෙනෙකි. උදෑසන ආහාරය සඳහා සෑම දිනකට ම පියාගෙන් රු. 50 බැගින් රැගෙන යන අතර එක් එක් දිනට විවිධ කෑම වර්ග මිලට ගනියි. මෙයින් අදහස් කරන්නේ,
1. වුවමනා සීමිත බව යි.    2. අවශ්‍යතා විවිධ බවයි.    3. අවශ්‍යතා සීමිත බවයි.    4. වුවමනා විවිධ බවයි.

03. ව්‍යාපාර බිහිවීමට පදනම ලෙස සැලකිය හැක්කේ,
1. අතිරික්ත නිෂ්පාදනය හා භාණ්ඩ හුවමාරුව යි.    2. අවස්ථා හා තර්ජන යි.
3. අවශ්‍යතා හා වුවමනා යි.    4. ශක්තීන් හා අවස්ථා යි.

04. පහත දැක්වෙන්නේ ඇල්මැති පාර්ශවයන් හා එම පාර්ශවයන් ව්‍යාපාර කෙරෙහි අල්ම දැක්වීමට හේතූන් ය.

| ඇල්මැති පාර්ශවයන් | ඇල්ම දැක්වීමට හේතු |
|---|---|
| 1. රජය | A. රැකියා සුරක්ෂිත බව |
| 2. තරගකරුවන් | B. ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම |
| 3. ගනුදෙනුකරුවන් | C. සේවා නියුක්තිය |
| 4. සේවකයන් | D. තම නිෂ්පාදිත වල මිල තීරණය කිරීම |

නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,
1. 1-A, 2-B, 3-C, 4-D    2. 1-D, 2-B, 3-C, 4-A    3. 1-C, 2-D, 3-B, 4-A    4. 1-C, 2-B, 3-D, 4-A

05. ආර්ථික පරිසරයට අයත් සාධක ඇතුළත් කාණ්ඩය නොවනුයේ,
1. පොලී අනුපාතය, ඉතුරුම්, දුගී බව
2. ජීවන වියදම, රැකියා වියුක්තිය, ජාත්‍යන්තර සබඳතා
3. උද්ධමනය, මිල මට්ටම, පෞද්ගලීකරණය, ඉතුරුම්
4. විදේශ විනිමය අනුපාත, ඉතුරුම්, ආදායම් ව්‍යාප්තිය, රැකියා සුලභතාවය

06. ගෝලීයකරණය යනුවෙන් අදහස් වනුයේ,
1. භෞතික වශයෙන් ලෝකය කුඩා වීමේ ක්‍රියාවලියයි.
2. වෙළෙඳාම සඳහා රටවල් එකතුවීමේ ක්‍රියාවලියයි.
3. රටවල් අතර ආර්ථික, සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීමයි.
4. ලෝකයේ පවතින රටාවට එරෙහිව සටන් කිරීම සඳහා රට රටවල්වල වෘත්තීය සමිති ඒකරාශීවීමේ ක්‍රියාවලියයි

07. ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන විශ්ලේෂණයේ දි,

| | |
|---|---|
| A - අයිතිකරුගේ මුල්‍ය හැකියාව | 1. තර්ජන |
| B - සහනාධාර සැපයීම | 2. අවස්ථා |
| C - ස්වභාවික ආපදා | 3. ශක්තිය |
| D - සේවකයන්ගේ කාර්ක්ෂමතාව අඩුවීම | 4. දුර්වලතා |

1. A-1 , B-2 , C-3 , D-4
2. A-3 , B-2 , C-1 , D-4
3. A-3 , B-2 , C-4 , D-1
4. A-3 , B-1 , C-2 , D-4

08. භාණ්ඩ හා සේවා සපයීම තුළින් ලාභ ඉපයීම අපේක්ෂා කරනු ලබන සංවිධානයකි. ඉහත ප්‍රකාශයට වඩාත් හොඳින් ගැලපෙන පදය කුමක් ද?

1. හවුල්
2. පෞද්ගලික සමාගම්
3. සංස්ථාව
4. ව්‍යාපාර

09. ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමාගම් යන සංවිධාන වර්ග 3ට ම පොදු ගුණාංග ඇතුළත් පිළිතුර වනුයේ,

1 අසීමිත වගකීම, අයිතිකරුවන් පාලනය කිරීම, පෞද්ගලික අංශයට අයත් වීම.
2. පෞද්ගලික අංශයට අයත් වීම, අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම
3. ලාභ අරමුණු කර ගැනීම, නෛතික පුද්ගලභාවය සහිත වීම, ගිණුම් තැබීම අනිවාර්ය නොවීම.
4. අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම, රජයේ පාලනයෙන් නිදහස් වීම.

10. රජයේ දෙපාර්තමේන්තුවක් ක්‍රියාත්මක වනුයේ,

1. සංස්ථාවක් යටතේ ය.
2. අමාත්‍යාංශයක් යටතේ ය.
3. පෞද්ගලික අංශය යටතේ ය.
4. රාජ්‍ය සමාගම් යටතේ ය.

● පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 11 හා 12 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

තම මවගේ පලපුරුද්ද හා අත්දැකීම් මත නයනා විසින් පාසල් නිල ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එම ව්‍යාපාරය "ලක්මාල් ටේලර් ෂොප්" ලෙස නම් කරන ලද අතර ව්‍යාපාරය ආරම්භයේ දී ම නයනා විසින් තම ව්‍යාපාරය රක්ෂණය කරන ලදි.

11. මෙම ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන වුවමනාවක් වනුයේ,

1. අධ්‍යාපනය
2 ඇඳුම්
3. පාසල් නිල ඇඳුම්
4. රක්ෂණය

12. මෙහි නයනා සතුව පවතින්නා වූ ශක්තියක් වනුයේ,

1. ව්‍යාපාරය රක්ෂණය කර තිබීම.
2. පාසල් නිල ඇඳුම් අලෙවි කිරීම.
3. තම මවගේ පළපුරුද්ද හා අත්දැකීම්
4. ව්‍යාපාරය""ලක්මාල් ටේලර් ෂොප්" ලෙස නම් කිරීම.

13. චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම්තීරුවෙහි (MICR) දක්නට පහත අංක පිළිවෙලට ගැලපුවිට නිවැරදි පිළිතුර වනුයේ,

| | |
|---|---|
| A - බැංකු ගිණුම් අංකය | B - ශාඛා අංකය |
| C - චෙක්පත් අංකය | D - බැංකුවේ අංකය |

1. C, A, B, D
2. C, D, B, A
3. A, C, B, D
4. C, B, D, A

14. ජංගම ගිණුමක හෝ ඉතිරිකිරීමේ ගිණුමක ඇති ශේෂය දක්වා පමණක් ගෙවීම කළ හැකි විද්‍යුත් මුදල් කාඩ්පත වනුයේ,

1. හර පත
2. පෙර ගෙවුම් කාඩ්පත්
3. ණය පත
4. ඇමරිකන් එක්ස්ප්‍රස්

15. රක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. දේපල රක්ෂණයේ දි එම දේපලේ නීත්‍යානුකූල අයිතිකරුට රක්ෂ්‍ය හිමිකමක් ඇත.
2. පුද්ගලයෙකුට සිය දරුවන් හා නෑදැයන්ගේ ජීවිත පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.
3. තමන් උකසට ගත් භාණ්ඩ පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් උකස්කරුට ඇත.
4. ණය දුන් අයෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා ණය ලබා ගත් තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

16. x තීරුවෙහි අළෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ද y තීරුවෙහි විචල්‍යන් සඳහා අයිතමයන් ද ඇතුළත් වේ.

| x **තීරුව** | y **තීරුව** |
|---|---|
| A - නිෂ්පාදිතය | 1. වට්ටම් |
| B - මිල | 2. ගුණාත්වය |
| C - ස්ථානය | 3. බෙදාහැරීම |
| D - ප්‍රවර්ධනය | 4. ප්‍රචාරණය |

1. A - 2, B - 1, C - 4, D - 3
2. A - 1, B - 2, C - 3, D - 4
3. A - 2, B - 1, C - 3, D - 4
4. A - 3, B - 2, C - 4, D - 1

17. ගිණුම්කරණයේ ප්‍රධානත ම අරමුණ වනුයේ,
1. ව්‍යාපාරයේ කාලපරිච්ඡේදය අවසානයේ මූල්‍ය ප්‍රකාශ සැකසීම යි.
2. ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව සඳහා අවශ්‍ය විවිධ තොරතුරු සැපයීම යි.
3. අධ්‍යක්‍ෂකවරුන්ට හෝ කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම යි.
4. ව්‍යවසාය පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම යි.

18. ව්‍යාපාර වත්කමක ලක්‍ෂණයක් නොවන්නේ,
1. එමගින් ආයතනය තුළට අනාගත ප්‍රතිඵල ජනනය විම
2. පිරිවැය හෝ අගය විශ්වාසනීය ලෙස මැනිය හැකි විම.
3. වත්කම් සඳහා භෞතික පැවැත්මක් පැවතීම.
4. අතීත ගනුදෙනුවක හෝ සිදුවීමක ප්‍රතිඵලයක් විම.

19. නිවැරදි ගිණුම්කරණ සමීකරනය වනුයේ,
1. වගකීම් = ප්‍රාග්ධනය - වත්කම්
2. ජංගම නොවන වත්කම් = මුළු හිමිකම් - ජංගම වත්කම්
3. හිමිකම = වත්කම් - වගකීම්
4. ජංගම වත්කම් = ජංගම නොවන වත්කම් - ජංගම වගකීම්

20. පහත x තීරුවේ ගිණුම් වර්ග ද y තීරුවේ එම ගිණුම් වල සටහන් කරන අයිතම ද දැක්වේ.

| x **තීරුව** | y **තීරුව** |
|---|---|
| i. වත්කම් ගිණුම | A - ගැණුම් |
| ii. වගකීම් ගිණුම | B - ප්‍රාග්ධනය |
| iii. හිමිකම් ගිණුම | C - බැංකු ණය |
| iv. ආදායම් ගිණුම | D - ණය ගැතියෝ |
| v. වියදම් ගිණුම | E - ලද කොමිස් |

x තීරුවේ ගිණුම් වර්ග y තීරුවේ සඳහන් අයිතම සමග අනුපිළිවෙලින් ගැලපු විට ලැබෙන පිලිතුර වනුයේ,
1. D, C, E, B, A
2. B, C, E, D, A
3. D, C, B, A, E
4. D, C, B, E, A

- ප්‍රශ්න අංක 21 සිට 24 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා පහත තොරතුරු උපයෝගි කර ගන්න.

A - රු. 25,000 ක් ණයහිමියන්ට ගෙවන ලදි
B - රු. 425,000 ක් ගෙවල් කුලි ලැබුණි
C - රු. 75,000 ක් අයිතිකරු ගැනිලි කරන ලදි.
D - රු. 50,000 ක උපකරණ මිලට ගන්නා ලදි
E - රු. 10,000 ක විදුලි ගාස්තු ගෙවන ලදි.

21. හිමිකම ස්ථාවර ව තිබිය දි වත්කම් හා වගකීම් යන දෙපාර්ශවයම අඩු විමට බලපානු ලබන්නේ,
1. A
2. C
3. D
4. E

22. වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ,
1. A
2. D
3. C
4. E

23. වියදම් හා වත්කම් වලට පමණක් බලපානු ලබන ගනුදෙනුව වන්නේ,
1. C
2. A
3. E
4. D

24. මෙම ගනුදෙනු අවසානයේ ජංගම වත්කම් වල වර්ධනය වන්නේ,
1. රු. 425,000
2. රු. 315,000
3. රු. 265,000
4. ඉහත කිසිවක් නොවේ.

25. රු. 420,000 ක ස්ථාවර තැන්පතුවක් ලංකා බැංකුවේ තැන්පත් කරන ලදි. නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. මුදල් ගිණුම හර රු. 420,000
   ස්ථාවර තැන්පතු ගිණුම බැර රු. 420,000
2. හිමිකම් ගිණුම හර රු. 420,000
   මුදල් ගිණුම බැර රු. 420,000
3. බැංකු ගිණුම හර රු. 420,000
   මුදල් ගිණුම බැර රු. 420,000
4. ස්ථාවර තැන්පතු ගිණුම හර රු. 420,000
   මුදල් ගිණුම බැර රු. 420,000

26. මූලික පොතෙන් සිදුවන්නේ,

A -ලෙජරය ප්‍රසාරණය වීම වැළැක්වීම
B -ගිණුම්කරණ දෝෂ අවමකර ගත හැකි වීම
C - වැරදි වංචා අවම කරගත හැකි වීම
D -ලෙජර් ගිණුම් වලට පිටපත් කිරීම පහසු වීම

1. A හා B 2. A, B හා D 3. A, C හා D 4. ඉහත සියල්ල ම.

27. සමන්ගේ ව්‍යාපාරයේ රු. 5,000 ක ණයගැතියෙකු තම ණය පියවීම සඳහා රු. 4,500 ක මුදලක් ලබා දෙන ලදි. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

1. මුදල් ගිණුම හර රු. 4,500
   ණයගැති ගිණුම බැර රු. 4,500
2. මුදල් ගිණුම හර රු. 5,000
   ණයගැති ගිණුම බැර රු. 5,000
3. මුදල් ගිණුම හර රු. 4,500
   දුන් වට්ටම් ගිණුම හර රු. 500
   ණයගැති ගිණුම බැර රු. 5,000
4. මුදල් ගිණුම හර රු. 5,000
   දුන් වට්ටම් ගිණුම බැර රු. 500
   ණයගැති ගිණුම බැර රු. 4,500

28. කසුන්ගේ ව්‍යාපාරයේ 2016.06.01 දින අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. 6,950ක මුදලක් ලැබුණි. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වන්නේ රු. 10,000 කි. ඒ අනුව 2016 මැයි මාසයේ සුළු මුදල් වියදම කොපමණ ද ?

1. රු. 10,000 2. රු. 16,950 3. රු. 3,050 4. රු. 6,950

29. ගිණුමක ශේෂය ඉදිරියට ගමන් කරන හා පියවී යන ගිණුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. වත්කම්, ආදායම් 2. ආදායම් , වියදම් 3. වත්කම්, වගකීම් 4. වත්කම්, හිමිකම්

30. විහඟ ගේ ව්‍යාපාරයේ රු. 100,000 ක් වටිනා භාණ්ඩ ණයට විකුණන ලදි. පසු අවස්ථාවක දී රු. 90,000 ක මුදලක් ලද අතර ඉතිරිය බොල් ණය සේ කපා හරින ලදි. ඉහත ගනුදෙනු වලට අදාල මුලාශ්‍ර ලේඛණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. විකුණුම් ජ'නලය, මුදල් පොත, පොදු ජ'නලය
2. ඉන්වොයිසිය, ලදුපත, පොදු ජ'නලය
3. ඉන්වොයසිය, ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය
4. ඉන්වෙයිසිය, ලදුපත, ජ'නල් වවුචරය.

31. ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ හර හා බැර දෙපත්තේ එකතුව අතර වෙනසක් ඇති කිරීමට බලපාන වරද වනුයේ,

1. ගැණුම් ජ'නලයේ එකතුව වු රු. 20,000 ගැණුම් ගිණුමට හර කොට ණය ගැති ගිණුමට බැර කිරීම.
2. දුන් වට්ටම් තීරුවේ එකතුව වු රු. 600 දුන් වට්ටම් ගිණුමේ දෙවරක් සටහන් වීම
3. ගොඩනැගිලි අලුත් වැඩියාව සඳහා වැය වු ර. 9,000 ක මුදල, ගොඩනැගිලි ගිණුමට හර කිරීම.
4. අයිතිකරු ව්‍යාපාරයේ මුදලින් ඔහුගේ නිවසේ විදුලි බිල රු. 15,000 ගෙවීම ගිණුම් වල දෙවරක් සටහන් වීම.

32. ව්‍යාපාරයක ශේෂ පිරික්සුම හර පැත්තේ එකතුව බැර පැත්තේ එකතුවට සමාන වීමෙන් පිළිබිඹු කරනුයේ,

1. හර කරන ලද සියලුම සටහන් බැර කර ඇති බවයි.
2. සියලුම ගෙවීම් නිවැරදිව පිළියෙල කර ඇති බවයි.
3. අංක ගණිතමය නිවරද්‍යතාවයක් පවතින බවයි.
4. තව දුරටත් ගිණුම්වල දෝෂ නොපවතින බවයි.

- පහත සදහන් තොරතුරු උපයෝගි කර ගනිමින් අංක 33 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. උදාර වෙළෙද ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සදහා පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත වේ.

**ශේෂ පිරික්සුම**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 500,000 |
| ගැණුම් හා විකුණුම් | 120,000 | 200,000 |
| තොගය 2015.01.01 දිනට | 5,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැයට | 400,000 | |
| මෝටර් රථ - පිරිවැයට | 150,000 | |
| යන්ත්‍ර - පිරිවැයට | 10,000 | |
| ණය ගැතියෝ හා ණයහිමියෝ | 50,000 | 48,000 |
| රක්ෂණ ගාස්තු | 2,000 | |
| දුරකථන වියදම් | 1,000 | |
| ගැනිලි | 2,000 | |
| දුන් වට්ටම් හා ලද වට්ටම් | 1,000 | 2,000 |
| ක්ෂය වෙන් කිරීම් 2015.01.01 දිනට | | |
| ඉඩම් ගොඩනැගිලි | | 100,000 |
| මෝටර් රථ | | 30,000 |
| බොල් ණය | 1,000 | |
| බැංකු අයිරාව | | 12,000 |
| මුදල් ශේෂය | 150,000 | |
| | 892,000 | 892,000 |

**අතිරේක තොරතුරු පහත දැක්වේ.**

1. 2015.12.31 දිනට තොගය රු. 5,000 කි.
2. 2015.12.31 දිනට උපචිත වියදම්
   දුරකථන වියදම් රු. 500, රක්ෂණ ගාස්තු රු. 250
3. ගොඩනැගිලි 5% කින්, මෝටර් රථ 10% කින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය යි.

33. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සදහා පිළියල කරන ලද ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දැක්විය යුතු විකුණුම් පිරිවැය වනුයේ,
   1. රු. 120,000
   2. රු. 200,000
   3. රු. 125,000
   4. ඉහත සදහන් කිසිවක් නොවේ.

34. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම් පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.
   1. මුදල්, මෝටර් රථ, ඉඩම් ගොඩනැගිලි
   2. ඉඩම් ගොඩනැගිලි, ණයගැතියෝ, මෝටර් රථ
   3. ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ, යන්ත්‍ර
   4. ඉඩම් ගොඩනැගිලි, යන්ත්‍ර, මෝටර් රථ ක්ෂය

35. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ශුද්ධ ලාභය වනුයේ,
   1. රු. 82,000
   2. රු. 39,750
   3. රු. 40,250
   4. රු.41,250

36. මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම් හි අවසාන වටිනාකම වනුයේ,
   1. රු. 591,000
   2. රු. 395,000
   3. රු. 205,000
   4. රු. 200,000

37. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනට හිමිකමේ වටිනාකම වනුයේ,
   1. රු. 554,250
   2. රු. 543,250
   3. රු. 456,750
   4. රු. 539,250

38. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනට මුළු වගකීම් හා හිමිකම් වල වටිනාකම වනුයේ,
   1. රු. 600,000
   2. රු. 60,750
   3. රු. 539,250
   4. රු. 589,000

39. මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනට හිමිකමේ ඇති වූ වෙනස කොපමණ ද?
   1. රු. 39,250
   2. රු. 20,000
   3 රු. 41,250
   4. රු. 600,000

40. බෙදාහැරීමේ වියදමක් නොවනු යේ,
   1. ගොඩනැගිලි ක්ෂය
   2. දුන් වට්ටම්
   3. මෝටර් රථ ක්ෂය
   4. බොල් ණය

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.